**කැලණිය විශ්වවිද්‍යාලය - ශ්‍රී ලංකාව**

**දුරස්ථ සහ අඛණ්ඩ අධ්‍යාපන කේන්ද්‍රය**

**ශාස්ත්‍රවේදී (සාමාන්‍ය) උපාධි තෙවන පරීක්ෂණය (බාහිර) - 2019**

**2023 දෙසැම්බර්**

**සමාජීය විද්‍යා පීඨය**

**සමාජ විද්‍යාව (නව/පැරණි නිර්දේශය)**

**සමාජ පර්යේෂණ ක්‍රම SOCI – E 3025**

ප්‍රශ්න පහකට (05) පමණක් පිළිතුරු සපයන්න.

**ප්‍රශ්න සංඛ්‍යාව : 08 යි.** **කාලය : පැය 03 යි.**

---

01. පර්යේෂණයක් යනු කුමක්දැයි පැහැදිලි කරමින් ස්වභාවික විද්‍යා පර්යේෂණ සහ සමාජීය විද්‍යා පර්යේෂණවල ඇති සුවිශේෂී ලක්ෂණයන් සන්සන්දනය කරන්න.

02. ප්‍රධාන සමාජ පර්යේෂණ වර්ග හඳුන්වා ගුණාත්මක පර්යේෂණ ප්‍රමාණාත්මක පර්යේෂණවලින් වෙනස්වන ආකාරය පැහැදිලි කරන්න.

03. සිද්ධි අධ්‍යයන විධික්‍රමය භාවිතය පිළිබඳ මූලික පැහැදිලි කිරීමක් කර සිද්ධි අධ්‍යයන සැලැස්මක අවධි විස්තර කරන්න.

04. සමාජ පර්යේෂණවල ක්ෂේත්‍ර දත්ත රැස්කිරීමේ ප්‍රධාන ශිල්ප ක්‍රමයක් ලෙස සහභාගිත්ව නිරීක්ෂණය භාවිත කිරීමේ දී ක්ෂේත්‍ර සටහන් හා නිරීක්ෂණ සටහන් ලිවීමේ දී අවධානය යොමු කළ යුතු කරුණු පිළිබඳ පැහැදිලි කරන්න.

05. ඔබ නියැදිකරණයේ න්‍යාය පැහැදිලි කරන්නේ කෙසේද? සසම්භාවී නියැදිකරණයේ හඳුනාගත හැකි ප්‍රධාන නියැදි ක්‍රම මොනවාද?

06. පර්යේෂණ යෝජනාවලියක ඇති ප්‍රධාන පියවර විස්තර කරන්න.

07. පර්යේෂණ ආචාර ධර්මවලට අනුකූලවීමේ වැදගත්කම විස්තර කරන්න.

08. පහත සඳහන් ඕනෑම මාතෘකා <u>දෙකක් (02)</u> පිළිබඳ සමාජ විද්‍යාත්මක සටහන් ලියන්න.

    i. සමීක්ෂණ විධික්‍රමය
    ii. දත්ත රැස්කිරීමේ ශිල්ප ක්‍රමයක් ලෙස ප්‍රශ්නාවලිය
    iii. පර්යේෂණ වාර්තාවක මූලිකාංග
    iv. විද්‍යාවන් වර්ගීකරණය කිරීම

***********************************